ඇඳීම - කඩේයාම හා ඇන්දවීම

ඇඳීම සහ ඇන්දවීම දෙකම කලාවන්. මේ කලාවේ අන්දන ක්‍රම දෙකක් තියෙනවා. ඒ රජාටඇඳීම සහ ගොනාට ඇන්දවීම වශයෙන්. හුඟ දෙනෙකුට රජාට නම් අඳින්න වෙන්නේ නැහැ. ඒත් ගොනාට නම් ඇන්ද වෙනවා. සමහරු නම් මේ කලාවන් දෙකම ප්‍රගුණ කරලා ඉන්නේ. බොහෝ දෙනෙක් හිතන්නේ තමන්ට අනුන්ව අන්දවන්න පුළුවන් කියලා. සමහරු නම් ඇන්දෙනවා. තවත් අය ඇන්දුනා වගේ ඉන්නවා ඒ බොහොම දුකින් වේදනාවෙන්. අඳිම කලාවට සම්බන්ධ නිසා කලාකරුවෝ ගැනත් ලියන්න වෙනවා. ප්‍රසංග වේදිකාවක වෛවර්ණ ඇඳුම්න් සැරසී අප හමුවට ආවත් ඔවුනුත් අප වැනිම ප්‍රශ්න මැද ජීවත් වෙන මිනිස්සුයි. ඒ මිනිසුන්ව ඕස්ට්‍රේලියාව වගේ තැනකදීත් අපේම අයුතු විදිහට සුරාකන්න උත්සාහ දැරීම බාල වැඩක්. මෙල්බර්න් ප්‍රසංග වේදිකාව මේ වෙනකොට තියෙන්නේ ඉතා ඉහළ තලයක. එයට ඇති ප්‍රේක්ෂක ඉල්ලුම ඉමහත්. මේ ඉල්ලුම තමන්ගේ ඉල්ලමක් කරගන්න උත්සාහ දරන ප්‍රසංග සංවිධායකයේ ඉඳීමත් ලැජ්ජාවක්.

කලාකරුවන්ට නිසි ගෙවීමක් නොකොට ඔවුන්ගේ ශ්‍රමය ලී කැබැල්ලකට හෝ කඩදාසි කොලයකට ලඝු කිරීම වටින්නේ නැහැ. බොහෝ වෙලාවට මේ අසාධාරණයට ලක්වෙන්නේ අපේ ගායිකා ගායිකාවනු හිතල බලන්න. ලංකාවේ පාවහන් කුට්ටමක් මිලදී ගනිද්දී 9.95 යි කියද්දී ඉතිරි සත පහ අපි තකන්නේ නැහැ. ඒත් ඕස්ට්‍රේලියාවේදී අපි ඉතිරි සත පහත් ගන්නේ ඒකටත් මෙහි වටිනාකමක් ඇති නිසා. තේරුම් ගන්න, මේ මිනිසුන් වේදිකාවට ගී ගයන්න එන්නේ දැඩි කැපවීමක් කරලා තමන්ගේ අතින් වියදම් දරාගෙන බව. ඇවිත් ගී කියලා කඩදාසියක් අරන් යන්නේ සතුටින් නොවන බව. ප්‍රසංගයක් අසාර්ථක නම් ගැටළුවක් නැහැ. අති සාර්ථක ප්‍රසංගවලින් ශිල්පීන්ට ගෙවීම නොකිරීම කැත වැඩක්. මේ මිනිස්සු හිඟවළ ඉන්නේ ඇන්දිලා නිසා නම් නොවෙයි. මහත්වරුනි, ඔබේ ප්‍රසංගය වර්තවත් වෙන්නේ මේ ශිල්පීන්ගේ දහදිය හා කැපවීම මතිනුයි. ඒ නිසා ඔවුන්ගේ ශ්‍රමයට නිසි වටිනාකමක් දෙන්න උත්සාහ කරන්න.

සංක්‍රමණිකයකුගේ සටහන

වඳුරු කථා

මව්බිමේ හොමික අඛණ්ඩතාවය හා ස්වෛරීභාවය ආරක්ෂා කර ගැනීමේ සටනට උරදීම සඳහා ඕස්ට්‍රේලියානුවාසී ශ්‍රී ලාංකිකයන්ගේ, කැන්බරා නුවර දී පැවැත්වූ ත්‍රස්ත විරෝධතා ව්‍යාපාරය සාර්ථක එකක්. මේ තීරයෙන් මේ ගැන කීපවතාවක්ම ලියලා ඇති. නැවතත් ලියන්නට හිතුවේ විශේෂ කාරණයක් නිසයි. උපන් දේශයට ආදරය කරන මිනිසුන්, පූජකවරුන් හා සංවිධාන වඳුරු සංවිධාන, වඳුරු ප්‍රජකයින් ලෙස හඳුන්වන මිනිසුන් ඉන්නා සමාජයක ඔබ සියලු දෙනා කරන මේ මෙහෙවර පැසසුම් කළ යුතුයි. උලව් සාමය හා වල්බුරු නිදහස රැකෙන්නේ ජීවත්වීමට දේශයක් ඉතිරි වුවහොත් පමණක් බව මොවුන් තේරුම් ගන්නේ කවදාද? මිතුවරුනි, මෙහි වෙසෙන සියළුම ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් ඔබ කරන මේ සද්කාර්යයෙහි ප්‍රතිඵලය භුක්ති විඳිනු ලබනු ඇත්තේ මව්බිමේ වෙසෙන අපගේ මතු පරම්පරාවයි. එසේ නම් ගොන්නු කෙසේ කීවත් "බුරන බල්ලන් කොතෙක් බිරුවත් තවලම නොනැවතී ඉදිරියට යන්නා" සේම ඔබගේ මේ ව්‍යාපාරය සාර්ථකව ඉදිරියට ගෙන යාමට දිරිය හා ශක්තිය පතනවා.

අක්ෂරය

අපිත් මේ ගැන නොලිය කොහොමද? මේ ගැන ලියපු සියයට 90 ක්ම ලිවිලේ මේක දැකල නොවෙයින්නේ. ඒ නිසා ඒක අපටත් වලංගුයි. ලියන්නේ අක්ෂරය ගැන නොවෙයි. මේ නොමිලේ ලබාදෙන පූර්ව ප්‍රචාර ගැන එක අතකට ඒකට දොස් කියන්නත් බැහැ. මෙහෙම උපක්‍රම නැත්නම් නිෂ්පාදකයෝ සදා අනාථයිනේ. මේ ප්‍රචාර නිසා පළවැනි සතියෙවත් මිනිසුන් මේව බලන්න එනවනේ. මේක පටන් ගත්තේ සූරිය අරගෙන්. දැන් ඒක වර්ධනය වෙලා සංස්කෘතිය හා සදාචාරය තමයි ඉදිරියට දාන්නේ. ඒක රකින හැටි තේරුම් ගන්න හරි අමාරුයි. "සූරිය අරගේ" පොඩි සාදුගේ හැසිරීම නිසා කඩවන ..... විමුක්තිගේ "සුලඟ එනු පිණිස" හි මිනිස්සු හමුදා භටයෝ ගස් ගල් අස්සේ රවනා කරන කොට විනාශ වන්නේ නැහැ. හදගමගේ කලින් චිත්‍රපටයේ බිරිඳගේ නිරුවත පෙන්වීමට නොබිඳෙන සදාචාරය අක්ෂරයේ මවගේ උඩුකය දැකීමෙන් බිඳෙනවනා. හරිය ගැටළු සහගතයි. අපිට මේක නොබලා හරි තීරණයක් ගන්න අමාරුයි. ඒත් ලංකාවේ චිත්‍රපට වලට ජන ජීවිතයට කරන්න පුළුවන් බලපෑම නම් අල්පයි. එහෙම කාලෙකුත් තිබුණා.

රොජර්

රොජර් සෙනවිරත්නගේ පලහිලව්වක් ගැන දැන ගන්නට ලැබුණා. බොහෝ නළු නිළියන්ගේ පොද්ගලික ජීවිතයේ හුඟක් ප්‍රශ්න තියෙන බව හැමෝම දන්න කාරණයක්. රෝජර් අපෙත් ප්‍රියතම නළුවෙක්. ඒත් ඊට වඩා ඔහු ප්‍රසිද්ධ ඔහුගේ දේශපාලනය නිසා. ඒ දේශපාලනය, ඒ විදිහට කරන්න ධෛර්ය තියෙන්නේ බොහෝ ටික දෙනෙකුටයි. මාධ්‍ය විසින් ඒ දේශපාලනය නිසාම මේ කාරණය බොහොම තද විදිහට විවේචනයට ලක් කරලා තියෙනවා. මේ ප්‍රශ්නයේ සැබෑ තත්ත්වය අපි දන්නේ නැහැ. සිද්ධිය වෙලා තියෙන්නේ අවුරුදු දෙකකට කලින්. සිදුවීම සත්‍ය නම් මෙහෙම කෙනෙක් කොහොමද විප්ලවවාදී දේශපාලන ව්‍යාපාරයක පෙමණ කලක් නියැලි හිටියේ. තද විනයක් සදාචාරයක් රකින පක්ෂයක්, ක්‍රියාකාරී සාමාජිකයෙක්, සංගම්වල නිලතල වගකීම් දරන හිටියේ කොහොමද? තේලි සේනානායක වගේ මිනිස්සුත් සදාචා රත්මක ප්‍රශ්න නිසා ඉවත් කරපු පක්ෂයක රොජර්ල රැදෙන්නේ කොහොමද? ප්‍රශ්න වැඩියි. ඒත් ඉතිං අපි තාම දන්නේ ප්‍රශ්නේ එක පැත්තනේ. බලමු ඉදිරියට අනිත් පැත්ත ගැන.

සංක්‍රමණිකයා

සංක්‍රමණිකයා අව්‍යාජ, සැබෑ කම්කරුවන් දැක නොමැති නම් මැයි දිනයට ජ.වි.පෙ. මැයි රැළියට යන්න

2006 මැයි සන්නස සඟරාවේ "සංක්‍රමණිකයකුගේ සටහන" මගින් මැයි දිනය පිළිබඳව දැක්වූ අදහසට තවත් සංක්‍රමණිකයකුගේ පිළිතුරක්.

ශ්‍රී ලංකාවේ සිට ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ බහුතරයක් බව නොරහසකි එහෙත් එම පුද්ගලයන් ඔවුන් කම්කරුවන් බව තේරුම් ගෙන ඇති බවක් කම්කරුවකු වන මා හට නොපෙනේ.

ශ්‍රී ලංකාවේ නම් කම්කරුවන් බහුතරයකට සැප පහසු නිවාසයක්, මෝටර් රථයක් මිහිරි සිහින වන අතර එම සිහිනය සැබෑ කර ගැනීමේ වාසනාව ඇත්තේ වෛද්‍යවරුන්, ඉංජිනේරුවරුන්, ගණාධිකාරීන් වැනි වෘත්තීන් ප්‍රමාණයක නිරත වන කම්කරුවනට පමණි. ඊට අමතරව යම් කම්කරුවකු සැප පහසු නිවසක, මෝටර් රථයක හිමිකරුවකු වන්නේ හම් එය සිදුවිය හැක්කේ ලොතරැයියක් දිනීමෙන් පමණි. දෑවැද්දක් හරහා එබන්ධකුවීමේ වාසනාව ඇත්තේත් ඉහත කී කම්කරුවනට පමණි. ලංකාවේ කම්කරුවාගේ යථාර්තය එය වුවද ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ ලාංකීය කම්කරුවා තවදුරටත් එබඳු අවාසනාවන්තයන් ලෙස ජීවත් වන්නේ නැත. ඔවුන්ගේ සෙනසුරු අපලය මෙහි පැමිණි පසු ක්‍රමයෙන් අවසන් වන්නට පටන් ගනී. සැප පහසු නිවසක්, මෝටර් රථයක් බැංකු ණයක මාර්ගයෙන් හෝ ලබා ගැනීමට තරම් ඔහු වාසනාවන්ත වේ.

මෙම භෞතික පරිවර්තනයත් සමගින් ඔහුගේ මනස ද පරිවර්තනය වීමට පටන් ගනී. බහුතරයකට තවදුරටත් ඔවුන් කම්කරුවන් බව සිතීම පවා ලැජ්ජාවක් වන අතර ඔවුන් දැන් සිතන්නේ ධනපතියන් ලෙසිනි. මෙම පරිවර්තනය මා සැබෑ ලෙස තේරුම් ගත්තේ මෙල්බර්න් නගරයේ මැයි දිනයට සහභාගි වීමෙනි. මා ලංකාවේ ජීවත් වූ කාලය තුළ සැබෑ කම්කරු පංති හැඟීමෙන් යුතුව නොකඩවා කම්කරු දිනය සැමරූ කම්කරුවෙක්මි. එබැවින් මෙවර මැයි දිනය සම්බන්ධයෙන් ඔබ ලියූ සටහන පිළිබඳව ඇතිවූයේ සතුටක් නොව අසතුටකි. මන්ද ඔබගේ පංති හැඟීමත් කම්කරුවන් පිළිබඳ ආකල්පයත් ව්‍යංගර්ථයෙන් පිළිබිඹු වන බැවිනි.

මා ලංකාවේ දී මැයි දිනය සැමරීම සඳහා සහභාගී වූයේ සැබෑ කම්කරු පංතියේ පක්ෂය වන ජ.වි.පෙ. මගින් සංවිධානය කරන මැයි දිනයටය. එහි පවතින දැඩි විනය, සංවිධානාත්මක බව සහ අලංකාරත්වය ඒ සඳහා මා පොළඹවන ලදී. ඒ හැර රු. 500/- වළ්, බත් පාර්සල්, කසිප්පු බෝතල් ජ.වි.පෙ. මැයි පෙළපාලිවල දක්නට නොතිබිණි. අඩුම තරමින් දුම් වැටියක් දල්වා ගත් කම්කරුවකුවත් මැයි පෙළපාලියේදී හෝ රැළියේදී දැකගත නොහැකි විය. එබඳු ආදර්ශමත් අන්දමින්, අභිමානයෙන්, ජ.වි.පෙ. ධජය යටතේ මැයි දිනය සැමරෙන අතර කම්කරු පංතියේ අයිතීන් කප්පාදු කරන ලද ධනපති පංතිය නියෝජනය කරන අනෙකුත් පක්ෂ සහ ඔවුන්ගේ අතකොලු බවට පත්ව ඇති සමහර වෘත්තීය සමිති රු. 500 වළ්, බත් පාර්සල් සහ කසිප්පු බෝතල් ද හරහා බත්බැලයන් බවට පත්ව ඇති කම්කරුවන් සහභාගි කර ගනිමින් මැයි දිනය මහ ඉහළින් (ස)මරති.

එබඳු පරිසරයක් තුළ 'සංක්‍රමණිකයකුගේ සටහන' ලියූ කම්කරු සහෝදරයාට පෙනුනේ ඔහු ලංකාවේදී සහභාගී වූ බත් බැලයන් බවට පත්වූ අවස්ථාවාදී කම්කරු නායකයන් නියෝජනය කළ මැයි පෙළපාලි වන්නට ඇතැයි මට හැඟේ. එසේ නොවේ නම් එදා වේල සොයා ගැනීමට ඇති අවස්ථාව පවා පසෙකට දමා, තමන් ඉතා දුක් මහන්සි වී උපයා ගත් මුදල බස්වලට ගෙවමින් මැයි දිනයට කලින් දිනයේ තම ගම්පළාත්වලින් පිටත්ව, සැබෑ කම්කරු පංති හැඟීමෙන් යුතුව අඹු දරුවන් ද සමඟ ගිනිකූඩක අව්වේ වේලි වේලි, නා කපන වැස්සේ තෙමි තෙමි ඉතා අභිමානයෙන් මැයි දිනය සමරන කම්කරුවන් නොදැක සිටීමේ හැකියාව නැත. ඔබ මෙතෙක් එවැනි අව්‍යාජ, සැබෑ කම්කරුවන් දැක නොමැති නම් එළඹෙන 2007 වසරේ මැයි දිනයට ජ.වි.පෙ. නායකත්වය සපයන මැයි රැළිය සහ පෙළපාලිය නැරඹීමට යන ලෙසට දැඩි කම්කරු පංති හැඟීමෙන් ආයාචනය කරමි. එසේ නොමැතිව පෙර පුරුදුද්ද 2007 දීත් ධනපති පංතියල හෝ ඔවුන්ගේ අතකොලු බවට පත්වූ වෘත්තීය සමිති විසින් මෙහෙය වන මැයි පෙළපාලිවලට සහභාගි වුවහොත් දැකගත හැකි වනුයේ ඔබ ලියූ ආකාරයේ කම්කරුවන් පමණක් බව මතක් කර දෙමි.

ඔබේ සටහන හරහා ලංකාවේ සහ ඕස්ට්‍රේලියාවේ සිටින අව්‍යාජ කම්කරුවන් උපහාසයට ලක් කර ඇත. ඒ කෙසේද යත් ලංකාවේ කම්කරුවා රු. 500/- ට බත් පාර්සලයට මැයි දිනය සමරන බවටත් ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ ලාංකීය කම්කරුවා බීයර් බොමින්, සොසේජස් කමින් මැයි දිනය සමරන බවටත් බොරු බේගල් දෙසා බෑම මගිනි. ලාංකීය සංක්‍රමණික කම්කරුවන්ගේ මැයි දිනය ඕස්ට්‍රේලියාවේ දී සමරනුයේ ජ.වි.පෙ. නායකත්වයෙන් පමණි. එම පෙළපාලිය තුළ ද ලංකාවේ ජ.වි.පෙ. මැයි පෙළපාලියේ මෙන් විනය ඉහළින්ම රැකෙන පරිදි කරයුතු සිදු කෙරේ. එබැවින් බීයර් බීබී යන කම්කරුවන් ජ.වි.පෙ. පෙළපාලියේ දී දැකිය නොහැකි විය. සොසේජස් කන කම්කරුවන් සිටියේ සොසේජස් කෑමට ඇති කෑදර කම නිසා නොව ඕස්ට්‍රේලියානු කම්කරුවන්, පංති හැඟීමෙන් යුතුව පිළිගන්වන ලද සොසේජස් ප්‍රතික්ෂේප කිරීම නරුම ක්‍රියාවක් වන බැවිනි. එබඳු දේ උළුප්පා පෙන්වමින් ඔබ ප්‍රදර්ශනය කිරීමට උත්සාහ කරන්නේ ජ.වි.පෙ. කෙරෙහි ඇති එක්තරා වෛරයක් ද යන්න මට තේරුම් ගත නොහැක.

මෙවර මැයි දිනයේදී ජ.වි.පෙ. ප්‍රධාන සටන් පාඨය ලෙස තෝරා ගත්තේ මිලේච්ඡ එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා අවශ්‍ය දේය. ඒ හරහා ජාත්‍යන්තර කම්කරු පංතිය තුළට එල්.ටී.ටී.ඊ. යට විරුද්ධ මතවාදය ගෙන යමින් ජාත්‍යන්තර වශයෙන් කොටි ත්‍රස්තවාදය පරාජය කර අපගේ පිතෘ භූමිය රැක ගැනීමට අවශ්‍ය ඉඩකඩ සකසා ගැනීමටය. මෙම උතුම් අරමුණ සාර්ථක කර ගැනීම සඳහා සියළු භේදයන් අමතක කොට සැබෑ ලාංකිකයන්, කම්කරුවන් ලෙසටත් ඕස්ට්‍රේලියානු කම්කරු ජනතාව එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදයට එරෙහිව පෙල ගැස්වීම සඳහාත් මෙවර මැයි දිනයට සහභාගී වන ලෙස ජ.වි.පෙ. ඕස්ට්‍රේලියානු කමිටුව විවෘතව ආයාචනය කළේය. එම ආයාචනයට ප්‍රතිචාර ලෙස පැමිණි සැබෑ දේශප්‍රේමී කම්කරුවන් බත් බැලයන් බවට සමාන කිරීමට ඔබ ගත් උත්සාහය තරයේ ප්‍රතික්ෂේප කරමි. එසේම ඔබ හිතන්නේ පුද්ගලයෙක් නම්, 'සංක්‍රමණකයෙකුගේ සටහන' හරහා ඔවුන් ගෙන් සමාව ගැනීමට තරම් ශක්තිය ධෛර්ය ලැබෙධියි මා ප්‍රාර්ථනා කරමි.

ඒ අතරම මෙම ලිපිය කිසිදු විකෘති කිරීමකින් තොරව පල කිරීමට තරම් ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩක් "සන්නස" තුළ ඇතැයි මා විශ්වාස කරන අතරම මෙය පළ නොවන්නේ නම් එම්බේ මා තේරුම් ගන්නේ ප්‍රජාතන්ත්‍රවාදී හිඳහස පවතින රටක "සන්නස" සඟරාව තුළ පවතින ප්‍රජාතන්ත්‍රවාදයේ දිග පළල බවද අවසානයේ සිහිපත් කරමි.

ජී. විජේසේකර විතාරණගේ

සංක්‍රමණිකයාගේ පිළිතුර

ශ්‍රී ලාංකාවෙහි හා මෙල්බර්න් හි වත්මන් කම්කරු දින සැමරීම් පිළිබඳව සංක්‍රමණිකයාගේ පොදු අර්ථ දැක්වීම හුදෙක් තමන් වෙත එල්ල වූවක් ලෙස සලකන ජ.වි.පෙ. හිතැති විජේසේකර විතානගේ ගේ ලියවිල්ල සතුටක් මෙන්ම දුක්ක ද දනවයි.

දුක නම් කම්කරුවා පිළිබඳව මාක්ස්වාදී විග්‍රහයන් නිවැරදිව අර්ථ දක්වන ඔබට පුවත්පතක තීරු ලිපියකින් කියැවෙන දේ නිවැරදිව ග්‍රහණය කර ගැනීමට නොහැකි වීමයි. සතුට නම් මාක්ස්වාදය හෝ නිර්ධන පංති අදහදායකත්වය ගැන වචනයක් නොදොඩන වත්මන් ජ.වි.පෙ. හි සාමාජික ඔබ තවමත් මාක්ස්වාදී මතවාදයන් හි එල්ලිගෙන හෝ සිටින බව දැන ගන්නට ලැබීමයි. එය ජ.වි.පෙ. වෙනුවෙන් වසර ගණනාවක් අපමණ කැපකිරීම් කළ අප හා ඔබ අතර තවමත් සමානකම් ඇති බව මතක් කරවයි.

කෙසේ වෙතත් ඔබගේ දීර්ඝ කරුනු දැක්වීම වෙනුවෙන් සංක්‍රමණිකයාගේ අදහස නම් ජ.වි.පෙ. යනු ශ්‍රී ලංකාවේ මෙතෙක් බිහිවූ නිවරදිව හා පිරිසිදුම පක්ෂය නොවුවත් සාපේක්ෂ වශයෙන් එය අන් පක්ෂ වලට වඩා බොහෝ ඉදිරියෙන් සිටින බවයි. **ජ.වි.පෙ හි හොඳ දේ හොඳ ලෙස දකින අපි වැරැද්ද විවේචනය කිරීමට පසුබට නොවන්නෙමු.**

අවසන් වශයෙන් මෙසේද කියන්නෙමු. පුවත්පත්වල ප්‍රජාතන්ත්‍රවාදයේ දිග පළල මැනීම ගැන හෝ ජාත්‍යන්තර කම්කරු පංතිය වෙත මතවාදයන් ගෙනයාම වැනි ප්‍රලාප නොදොඩා මෙහි වෙසෙන ශ්‍රී ලාංකික ජනතාව (කම්කරුවන්) වෙත පක්ෂයේ මතවාදය ගෙනයාමේ ක්‍රමයක් ගැන ගැඹුරින් සිතීම වඩා යෝග්‍ය බවයි.

- **සංක්‍රමණිකයා** -